# මහින්ද ජනාධිපතිවන්නේ ද නැත් ද?

මහින්ද රාජපක්ෂ මහතාට ජනාධිපතිවීමේ අවශ්‍යතාවක් නොමැති බව පෙනෙන්නට ඇත. ඔහු දෙමළ ජාතිවාදය ගැන කිසිවක් නොකියයි. මෙරට ඇති ප්‍රශ්නය කුමක්දැයි ඔහු වටා සිටින ක්‍රිස්තියානි සංස්කෘතියෙහි කසිකබල් උගතුන් වටහාගෙන ඇති බවක් නො පෙනෙයි. බටහිර මතවාද (ප්‍රවාද යනු ද මතවාද පමණක් බව මේ උගත්තු නොදනිති) ටිකක් අහුලාගෙන එවා විභාගවලට ක්‍රමවත්ව ඉදිරිපත්කර ලකුණු ලබාගැනීම හැර මේ ඊනියා උගතුන් විසින් කරනු ලැබ ඇති වෙනත් කාරියක් නැත. මොවුන්ගෙන් ඇතැමෙක් වාමාංශිකයන් ලෙස පෙනී සිටිය ද බොහෝ විට තම ආයතනවල වෘත්තීය සමිති කටයුත්තකටවත් සහභාගි නො වෙති. වෘත්තීය සමිති ගැන ද මොවුන් දන්නේ බටහිරයකු ලියූ පොත්වල ඇති කරුණු පමණකි. මේ අතර මෑතක් වන තුරු එ ජා ප සාමාජිකයකුව සිටි ගණකාධිකරණය හා කළමනාකරණය ගැන මහා විශාරදයකු යැයි තමන් හඳුන්වාගත් අයකු ද රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය කෙටුම්පත් කිරීමේ යෙදී සිටින බව සැළ ය. මෙවැන්නන්ගේ සහභාගිත්වයෙන් බිහිවන ප්‍රතිපත්ති ප්‍රකාශයක් කෙසේවනු ඇත්දැයි සිතාගැනීම අපහසු නො වෙයි.

රාජපක්ෂ මහතාට ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස්කිරීමේ කටයුත්ත අද ඉතා තීරණාත්මක කටයුත්තක් බවට පත්වී ඇත. එ මහතා වටා ඇති ඊනියා උගතුන්ගෙන් සමහරකු සිතන්නේ රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්දය නොදෙන සිංහලයන් කෙසේ වෙතත් රාජපක්ෂ මහතාට ඡන්දය දෙන බැවින් ඊනියා සුළුජාතික ඡන්ද ලබාගැනීමෙන් රාජපක්ෂ මහතාට ජනාධිපති විය හැකි බව ය. රාජපක්ෂ මහතාට දෙමළ ජාතිවාදයට එරෙහිව ස්ථාවරයක් ගැනීමට නොහැකි නම් ඉතා විශාල පිරිසක් මෙවර ඡන්දය දීමෙන් වැළකී සිටිනු ඇත. එ මහතාගේ ඇතැම් ඊනියා උපදේශකයන් සිතන්නේ ජ වි පෙ හිතවතුන්ද අවසානයේ දී එ මහතාට ඡන්දය දෙනු ඇත කියා ය. එහෙත් එ එසේ නොවන බවට කරුණු විද්‍යමාන වෙමින් පවතියි. රාජපක්ෂ මහතා කියන සියළු දෙනාට පිළිගත හැකි ගෞරවනීය සම්මානය වැනි පුහු වචනවලින් ඡන්දදායකයන් රැවටීමට එ මහතාගේ උපදේශකයන් බලාපොරොත්තුවන්නේ නම් එ මුළාවකි. මේ ගෞරවනීය සාමය කුමක්දැයි පැහැදිලි කළ යුතු වෙයි. එය ඒකීය රට රකින සාමය ද නැත්නම් සහසන්ධීය රාජ්‍යයක් බිහිකරන බටහිර යටත්විජිතවාදීන්ගේ ඊනියා සාමය ද? සාමය යැයි කී පමණින් සියල්ලන් විසින් හැඳින්වෙනුයේ එකම දෙයක් නොවන බව සාමයට විරුද්ධ වන්නේ පිස්සන් යැයි කියන රාජ්‍ය නොවන සංවිධානවල ගැත්තන් වූ හිටපු සිවිල් සේවක ඇමතිවරුන්ට මතක්කර දියයුතුව ඇත.

අප ලියන කියන දේ අන්තවාදී ජාතිවාදී සුළු පිරිසකගේ මතයක් පමණක් බව අර කසිකබළුන් රාජපක්ෂ මහතාට පවසනු ඇත. එහෙත් අප ඉදිරිපත්කරන මතය නොසලකා රාජපක්ෂ මහතාට කෙදිනකවත් ජනාධිපති විය නොහැකි බව නම් අද අපට කිසිදු සැකයකින් තොරව පැවසිය හැකි ය. එ මහතාට වැට උඩ හිඳ ජනාධිපති විය නොහැකි ය. අද දෙමළ ජාතිවාදය ඔඩුදුවා ඇත. රාජපක්ෂ මහතා එ පිළිබඳ පැහැදිලි ස්ථාවරයක් ගතයුතු ව ඇත. එ ස්ථාවරය දෙමළ ජනයා සැනසීම සඳහා යැයි කියන්නේ නම් රාජපක්ෂ මහතාගේ පරාජය නියත ය. කසිකබල් උගතුන් කෙසේ කීව ද මධ්‍යම හා ඉහළ මධ්‍යම පාංතික දෙමළ ජනයාගෙන් අතිවිශාල බහුතරය ඡන්දය දෙනු ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතාට ය. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්දය දී ඇති ආකාරය විශ්ලේෂණය කළහොත් එ බව දැනගැනීමට හැකිවනු ඇත. වතුකරයේ දෙමළ ජනයා රනිල් වික්‍රමසිංහ මහතා අත්හැර රාජපක්ෂ මහතාට ඡන්දය දෙනු ඇතැයි බලාපොරෙත්තු විය හැකි ද? මේ ඡන්දවලින් විශාල බහුතරය තොන්ඩමන් මහතාට අවශ්‍ය ආකාරයට දෙන බවට සැකයක් නැත. තොන්ඩමන් මහතා ආධාරකරන්නේ රාජපක්ෂ මහතාට යැයි ඔහුගේ ආධාරකරුවන් සිතන්නේ ද?

යම් අයුරකින් එසේ ආධාරකළ ද ජ වි පෙරමුණට වඩා ඡන්ද තොණ්ඩමන් මහතාට ඇතැයි සිතන්නේ නම් එය ද මුළාවකි. ජ වි පෙරමුණ රාජපක්ෂ මහතාට සහාය නොදෙන්නේ නම් ඔහුට නැතිවන්නේ ජ වි පෙරමුණේ ඡන්ද පමණක් නො වෙයි. ජ වි පෙ හා ශ්‍රී ල නි ප අතර ඇතිවන සන්ධානයකට ඡන්දය දීමට බලාපොරොත්තුවෙන් සිටින විශාල පිරිසක් එසේ සන්ධානයක් ඇති නොවුනහොත් කිසිවකුටවත් ඡන්දය නොදෙනු ඇත. එකයි එකයි එකතුකළ විට දෙකට වැඩිවන්නේ මෙවැනි අවස්ථාවල දී ය. තොණ්ඩමන් මහතාගේ ඡන්ද කොතරම් ඇත්දැයි මේ මහත්වරු ගණන්බලා ඇත්

© Prof. Nalin De Silva

ද? තමන්ට බටහිරයන් හා ඔවුන්ගේ ගැත්තන් විසින් කියා දෙනු ලැබ ඇති මතිමතාන්තර අනුව කටයුතුකර මේ ජනාධිපතිවරණය දිනීමට මහින්ද රාජපක්ෂ මහතාට නොහැකි වනු ඇත.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අප විසින් මුලසිටම, එනම් ඇය දෙමළ ජාතිවාදයේ ගැත්තන් විසින් ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස්කිරීම සඳහා 1992 දී මෙරටට ආනයනය කරනු ලැබූ අවස්ථාවේ සිටම, හඳුන්වාදෙනු ලැබුයේ දෝන කතිරිනාවක ලෙස ය. මුල් දෝන කතිරිනාට බටහිර අධ්‍යාපනයක් දී පරංගි සංස්කෘතියෙහි හදා වඩා පෘතුගීසීන් අදහස් කෙළේ ඈ ලවා කන්ද උඩරට ද තම ආධිපත්‍යයට ගැනීමට ය. එහෙත් කොනප්පු බණ්ඩාර හෙවත් විමලධර්මසූරිය රජු ඒ සැලැස්ම පරාජය කෙළේ ය. බ්‍රිතානීන් ඇතුළු බටහිරයන් හා ඔවුන්ගේ ගැති මෙරට විජාතික බලවේග ද කුමාරතුංග මහත්මිය මෙරටට ආනයනය කරනු ලැබුයේ ශ්‍රී ල නි ප වෙනස්කර දෙමළ ජාතිවාදයට රට පාවාදීමට ය. එහෙත් අවාසනාවකට අපට මෙකල විමලධර්මසූරිය කෙනකු නැත. කෙසේ වෙතත් විජාතික සැලසුම් පරාජයකිරීම සඳහා තීරක බලවේගයක් අවශ්‍ය වේය යන අදහස පළමුවෙන් ම අපි ඉදිරිපත් කෙළෙමු. ජනතාව 1994දී ඒ ප්‍රතික්ෂේප කළ ද පසුව 2004දී එකඟ විය. කෙසේ වෙතත් අපි ශ්‍රී ල නි ප නැවතත් පණස්හයේ පක්ෂය බවට පත්කිරීම වෙනුවෙන් පෙනී සිටියෙමු. අද මහින්ද රාජපක්ෂ මහතා කළ යුතුව ඇත්තේ ශ්‍රී ල නි ප නැවතත් පණස්හයේ පක්ෂය බවට පත්කිරීම ය. ඒ ජාතිකත්වයේ සිංහලත්වයේ පක්ෂය බවට පත්කිරීම ය. මහින්ද රාජපක්ෂ මහතා ඒ වෙනුවෙන් පෙනී නොසිටින්නේ නම් ඔහු ද අනුගමනයකරන්නේ කුමාරතුංග මහත්මියගේ විජාතික ගැති ප්‍රතිපත්ති ය. එවිට රනිල් වික්‍රමසිංහ මහතා පරාජයකරන්නේ අහවල් දෙයක් වෙනුවෙන් ද යන අදහස ජනතාවට ඇතිවෙයි. ශ්‍රී ල නි පක්ෂයට සැමදාම ඡන්දය දෙන පිරිස එ ජා පක්ෂයට එලෙස ඡන්දය දෙන පිරිසට වඩා අඩු ය. ශ්‍රී ල නි පක්ෂය ජයග්‍රහණයකරන්නේ සිංහලයන්ගේ පාවෙන ඡන්ද වැඩි ප්‍රමාණයක් දිනාගැනීමට සමත් වූ අවස්ථාවල ය. රාජපක්ෂ මහතාගේ කසිකබල් උපදේශකයන් කුමක් කීව ද ඊනියා සුළු ජාතික ඡන්දවලින් වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ එ ජා පක්ෂයට ය. රාජපක්ෂ මහතා අනුගමනයකරන්නේ ද චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ සිංහල විරෝධී විජාතික ගැති ප්‍රතිපත්ති නම් මෙවර පාවෙන ඡන්ද වැඩිගණනක් දිනාගැනීමට ඒ මහතාට නොහැකිවනු ඇත.

රනිල් වික්‍රමසිංහ මහතා දිනවීමට බටහිරයන් හා අනෙක් විජාතික බලවේග ක්‍රියාත්මකකරන එක් උපක්‍රමයක් වනුයේ රාජපක්ෂ මහතා ලවා ද දෙමළ ජාතිවාදයට පක්ෂපාතී ප්‍රතිපත්තියක් අනුගමනයකරවීම ය. අද ඒ මහතාට කිට්ටු වී ඇති සියළු දෙනා තමාට හෝ ශ්‍රී ල නි පක්ෂයට හෝ හිතවත් යැයි ඔහු අදහස්කරන්නේ නම් ඔහු තවමත් දේශපාලන පරිණතභාවයක් ලබා ඇතැයි කිව නො හැකි ය. අද ආණ්ඩුව වළිකන්නේ කදිරගාමර් මහතා ඝාතනය කිරීමෙන් පසුව කොටි ආණ්ඩුව සමග නැවත සාකච්ඡා කිරීමට එකඟවීම තමන් ලත් මහා ජයග්‍රහණයක් බව පෙන්වීමට ය. කදිරගාමර් මහතාගේ අවසාන කාලයේ දී ඒ මහතා විදේශ ඇමති ලෙස කටයුතු කෙළේ නමට පමණක් බවත් නියම ඇමති වූයේ විජාතික බලවේග විසින් ආනයනය කරනු ලැබූ ධනපාල කෙනකු බවත් දන්නෝ දනිති. මේ සාම වෙළෙන්දෝ බටහිර ක්‍රිස්තියානි රාජ්‍යවල ඊනියා සටන් විරාමය තවදුරටත් ඉදිරියට ගෙනයෑම අත්‍යවශ්‍ය කරුණක් ලෙස පෙන්වති. කදිරගාමර් මහතා ඝාතනයකිරීමෙන් පසුව බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය සියල්ල එකහෙළා ප්‍රකාශකෙළේ ඊනියා සටන් විරාමය කෙසේවත් අත්නොහැරිය යුතු බව ය. කොටින්ට රිසි සේ මිනීමැරීමට ඉඩදෙන මේ සටන්විරාමය තවදුරටත් ගෙන යායුතු යැයි ආගමින් මෙන් ම සංස්කෘතියෙන් ද ක්‍රිස්තියානි වූ ධනපාලලා කියන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය ඝාතනයකිරීමට ඇති අවශ්‍යතාව නිසා ය. කදිරගාමර් මහතා ද ක්‍රිස්තියානි පවුලක උපත ලද නමුත් ඇංග්ලිකන් ක්‍රිස්තියානි පල්ලියේ ආයතන වූ ත්‍රිත්ව විද්‍යාලයේ හා ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙහි ඉගෙනීම ලැබූ නමුත් ඔහු සිංහල බෞද්ධ සංස්කෘතිය දැනසිටියා පමණක් නොව හැකි විටෙක ඒ සංස්කෘතියෙහි ජීවත්වීමට ද අමතක නො කෙළේ ය. ඒ මහතාගේ අවමංගල කටයුතු බෞද්ධ සංස්කෘතියට එකඟවන අයුරින් කිරීම ගැන සිංහල බෞද්ධ සංස්කෘතික ආධිපත්‍යයකට දෙස් දෙවොල් තබන පිරිස් අමතක කරන කරුණු දෙකක් වෙයි. පළමුව කදිරගාමර් මහතා තම අවමංගල කටයුතු බෞද්ධ චාරිත්‍රානුකූලව කරන ලෙසට තම බිරියගෙන් ඉල්ලා තිබූ බව ය. එයටත් වඩා වැදගත් දෙවැන්න නම් මේ දීනයන් මුළුමනින්ම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට යටවී සිටීම ය. ඔවුන්ට නොතේරෙන ප්‍රධානම කරුණ නම් ඔවුන් හැසිරවෙන දැනුම සම්පූර්ණයෙන් ම ක්‍රිස්තියානි හා අධිරාජ්‍යවාදී දැනුමක් බව ය. බෞද්ධයන් වුවත්, අනාගමික වුවත්, මොවුහු දැනුමෙන් හා සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වෙති. අද රාජපක්ෂ මහතා වටේ හිඳිමින් ඒ මහතාගේ පරාජය උදෙසා හටයුතු කරන්නේ එවැනි පිරිසකි. රාජපක්ෂ මහතාට ජනාධිපතිවීමට අවශ්‍ය නම් කළ යුත්තේ පෞද්ගලිකව කබ්රාල්ලාගෙන් හා අගමැති ලෙස ධනපාලලාගෙන් නිදහස්වීම ය.

© Prof. Nalin De Silva